"මත් බව ඇති කරන සෑම දෙයක්ම තහනම්ය."

අබූ බුර්දා තුමා තම පියාණන් වූ අබූ මූසා අල්-අෂ්අරී (රළියල්ලාහු අන්හු) තුමාගෙන් ලබා මෙසේ වාර්තා කරන ලදී: සැබැවින්ම නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් යමන් දේශයට එතුමාව යැවූහ. එහි නිශ්පාදිත බීමක් සම්බන්ධයෙන් එතුමාණෝ ඔහුගෙන් විමසා සිටිමින් "මේ කුමක්දැ?"යි ඇසීය. එතුමා "අල්-බිත්උ, වල් මිද්ර්" යනුවෙන් පැවසීය. "බිත්උ" යනු කුමක්දැ?"යි අබූ බුර්දා තුමාගෙන් විමසන ලදී. එතුමා: "එය මී පැණි සාරයයි." 'මිද්ර්' යනු බාර්ලි සාරයයි. එවිට එතුමාණෝ මත්බව ඇති කරන සෑම දෙයක්ම තහනම්ය." යැයි පැවසූහ. (මෙය ඉමාම් බුහාරි තුමා විසින් වාර් තා කර ඇත.) මුස්ලිම් තුමා ද මෙය වාර්තා කර ඇති අතර එතුමාගේ වදන් පෙළ මෙසේය: සැබැවින්ම නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ මා හා මුආද්ව යමන් දේශයට යැවූහ. එවිට මම: "අහෝ අල්ලාහ්ගේ දූතයාණනි, අපේ ප්රදේශයේ නිෂ්පාදනය කරන ලද පානයක් ඇත. එයට බාර්ලි වලින් සාදන ලද අල්- මිZසරු(සාරය) හා පානය යනුවෙන් පවසනු ලැබේ. මී පැණි වලින් සාදන ලද අල්බිත්උ (සාරය) යනුවෙන් පවසනු ලැබේ. එවිට එතුමාණෝ "මත්බව ඇති කරන සෑම දෙයක්ම තහනම්ය." යැයි පැවසූහ. මුස්ලිම් තුමා සතු වාර්තාවක: එතුමාණෝ මෙසේ පැවසූහ: සලාතයෙන් දුරස්
කරමින් මත් බව ඇති කරන සෑම දෙයක්ම හරාම් (තහනම්) වේ. එතුමා සතු තවත් වාර්තවක: "අල්ලාහ්ගේ දූතයාණන් හට ජවාමිඋල් කලිම් හෙවත් අවසානයේ සංශිප්ත චතුර වදන් දෙනු
ලැබූහ. එවිට එතුමාණෝ: "සලාතයෙන් මත් කරවන, මත්බව ඇති කරන සැම දෙයක්ම මට තහනම් කරනු ලැබීය." යැයි පැවසුහ.
[صحيح] [رواه البخاري ومسلم]

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ තමන්ව යමන් දේශයට යැවූ බව අබූ මූසා අල්- අෂ්අරී (රළියල්ලාහු අන්හු) තුමා දන්වා සිටිමින්, නිෂ්පාදනය කරන ලද පානයක් පිළිබඳව එය තහනම් දැ?යි විමසා සිටිනු ලැබූ අතර නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ ඒ ගැන විස්තර කළහ. එවිට අබූ මූසා (රළියල්ලාහු අන්හු) තුමා: එය අල්-බිත්උ: මී පැණි සාරය හා අල්- මිZසරු: බාර්ලි සාරය යනුවෙන් පැවසීය. ඒ වන විට එතුමාණන්ට ජවාමිඋල් කලිම් හෙවත් සංශිප්ත චතුර වදන් මඟින් දේශනය කිරීමේ හැකියාව ලැබ තිබුණි. එවිට නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් මෙසේ පැවසූහ. "මත්බව ඇති කරන සෑම දෙයක්ම හරාම් (තහනම්) වේ."

https://sunnah.global/hadeeth/si/show/66536